# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,960 - 2016 මාර්තු මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2016.03.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | 232 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 234 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 234 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 238 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 අප්‍රේල් මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 අප්‍රේල් මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

231 – B 081041 —402 (2016/03)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2016 අංක 201

MOD/DEF/02/01/ENL/09/UNI.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත සඳහන් කෙඩෙට් නිලධාරි/නිලධාරිණිය 2015 ජනවාරි මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත් කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙන සේ, ඉංජිනේරු සේවා බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

සී/58615 කෙඩෙට් නිලධාරි පිටුවල කංකානම්ගේ හර්ෂක කුමාර අලහකෝන්
සී/58617 කාන්තා කෙඩෙට් නිලධාරි හිද්දාදුර තිළිණි ශ්‍රී මධුශිබා ද සොයිසා

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජී. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

03 - 568

---

2016 අංක 202

MOD/DEF/03/02/PRO/RNF/02/02.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2015 ජනවාරි මස 18 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ)] ගුවන් සුපුන්සර ලීලාරත්න, එන්ආර්එස් 2225, ශ්‍රීලංනාහ

*2015 අප්‍රේල් මස 23 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන් :*

ලුතිනන් (වි) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි)] නුවන් රංගනාත් කරුණාරත්න, එන්ආර්එල් 1752, ශ්‍රීලංනාහ

*2016 ජනවාරි මස 19 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ)] මනමෙල් දුර ඩිලාන් අකලංක සුසිරිපාල, එන්ආර්ඊ 2393, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජී. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

03 - 665

---

2016 අංක 203

MOD/DEF/03/02/PRO/RNF/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2016 ජනවාරි මස 16 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන් :*

ලුතිනන් (වි) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි)] රංචාගොඩගේ දොන් සංජය අරුණප්‍රිය, එන්ආර්එල් 1820, ශ්‍රීලංනාහ

*2016 ජනවාරි මස 16 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ)] සුසන්ත ගුණසේකර, එන්ආර්ඊ 1824, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජී. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

03 - 666

2016 අංක 204

MOD/DEF/03/02/PRO/RNF/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2015 ජුලි මස 18 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් ඃ*

ලුතිනන් (සැ) චන්ද්‍රසේකර මුදියන්සේලාගේ ධනුෂ්ක අසේල චන්ද්‍රසේකර, එන්ආර්එස් 2268, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජී. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

03 - 663

2016 අංක 205

MOD/DEF/03/02/RNF/COM.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

*2016 ජනවාරි මස 08 වැනි දින සිට ලුතිනන් වශයෙන් ඃ*

1. ලුතිනන් තලපිටි දේවගේ මධුසංඛ පියුමාල් තලපිටිය, එන්ආර්එච් 3848, ශ්‍රීලංනාහ
2. ලුතිනන් වාසල මුදියන්සේලාගේ මෙවන් සචින්ත ජයතිලක, එන්ආර්එච් 3849, ශ්‍රීලංනාහ
3. ලුතිනන් ජයලත්තුංග ප්‍රදීප් කුමාර ජයලත්, එන්ආර්එච් 3850, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජී. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

03 - 664

---

2016 අංක 206

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර නාවික බලකායේ කෙටිකාලීන අධිකාරියෙන් මුදාහැර නිත්‍ය අධිකාරිය පිරිනැමීමක්

2016 ජුනි මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම සඳහන් නිලධාරියා හට ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය බලකායේ නිත්‍ය අධිකාරිය පිරිනැමීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

වෛද්‍ය ලුතිනන් හසිත සවත් දේවප්‍රිය කුඩාහෙට්ටි, එන්ආර්එම් 3081, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජී. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

03 - 708

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2016 අංක 207

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

සමන් කුමාර අතාවුදහෙට්ටි මහතා 2015 ජනවාරි මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම් (මාධ්‍ය) වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

03 - 575/1

2016 අංක 208

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ එල්. ජේ. එම්. ජී. සී. බණ්ඩාර මහතා 2015 දෙසැම්බර් මස 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව, වැඩබලන වනජීවී අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

03 - 575/2

---

2016 අංක 209

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

සී. එස්. අබේසේකර මහත්මිය 2015 දෙසැම්බර් මස 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස තුනක (03) කාලයකට හෝ අදාළ තනතුරට සුදුසු නිලධාරියකු පත් කරනු ලබන තෙක් හෝ යන දෙකෙන් කවර හෝ කලින් එළඹෙන දින දක්වා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ වැඩබලන ලේකම් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

03 - 575/3

---

# රජයේ නිවේදන

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/07/2016/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2016.04.01 වැනි දින සිට 2016.04.15 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති

කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2016.04.22 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී කොට්ඨාසයේ 596 වෙළුමේ 297 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, හේවාගම් කෝරළේ කොස්වත්ත පාර, කලපලුවාව පිහිටි 'දෙල්ගහවත්ත,' දෙල්ගහ කුරුඳුවත්ත' නැමති ඉඩමට බලයලත් මානක පී. පීලික්ස් ඩයස් මහතා විසින් 1991.12.04 වැනි දින මැන සාදන ලද අංක 389 දරන පිඹුරේ ලොට් 'ඒ 1' සඳහා මායිම්,<br><br>*උ.නැ.* ඃ ලොට් 7 (අඩි 10 පළල පාර),<br>*ද.නැ.*ඃ ලොට් ඒ 2,<br>*ද.බ.* ඃ ඩේවිඩ් ඒ. පෙරේරාට අයත් ඉඩම සහ පාර<br>*උ.බ.* ඃ අංක 310 පිඹුරේ ලොට් සී4<br>ප්‍රමාණය ඃ අ. 00, රූ. 00, පර්. 12.69 | සී. ජේ. ද සිල්වා අමරතුංග ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1991.12.09 වැනි දින අංක 2466 දරන විකුණුම්කරය. |

03 - 604

---

එල්.ඩී.බී. 277/40

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත

16 වැනි වගන්තිය යටතේ වූ නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 16 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් වන මා විසින්, මේ නියමය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්මාරක ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා "පැරණි ස්මාරක" වශයෙන් සලකනු ලැබිය යුතු බව ප්‍රකාශයට පත් කරමි.

අකිල විරාජ් කාරියවසම්,
අධ්‍යාපන අමාත්‍ය.

2016 පෙබරවාරි මස 16 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

*ප්‍රකාශයට පත්කරනු ලබන පැරණි ස්මාරක ලේඛනය*

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඌරුබොක්ක දකුණ ග්‍රාමනිලධාරී වසමේ පිහිටි ඌරුබොක්ක ග්‍රාමයට අයත් ලන්දේසි යුගයේ ඉදිකරන ලද පැරණි බැම්ම.
2. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හම්බන්තොට ග්‍රාම නිලධාරී වසමට අයත් හම්බන්තොට නගරය බටහිර අංක 09 ග්‍රාමයේ ටවර්හිල් මාර්ගයේ පිහිටි දිස්ත්‍රික් ලේකම් කාර්යාල භූමියේ ඇති පැරණි ගොඩනැගිල්ල.
3. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හම්බන්තොට ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හම්බන්තොට නගරය බටහිර අංක 09 ග්‍රාමයේ ටවර්හිල් මාර්ගයේ ඇති පැරණි උසාවි සංකීර්ණයට අයත් ප්‍රධාන ගොඩනැගිල්ල හා අනෙක් පැරණි ගොඩනැගිලි තුන.
4. බටහිර අංක 09 ග්‍රාමයේ ටවර්හිල් මාර්ගයේ ඇති මහේස්ත්‍රාත් හෙන්රි ජෝන්ස් ජෝන් ස්කවයර්ගේ සොහොන.
5. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හම්බන්තොට ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හම්බන්තොට නගරය බටහිර අංක 09 ග්‍රාමයේ ටවර්හිල් මාර්ගයේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු භූමියට ඉදිරිපස යාබද භූමියේ ඇති පැරණි එල්ලුම්ගහ.
6. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හම්බන්තොට ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හම්බන්තොට නගරය බටහිර අංක 09 ග්‍රාමයේ ටවර්හිල් මාර්ගයේ ඇති දිසාපති නිලනිවස ලෙස භාවිතා කරනු ලබන පැරණි ගොඩනැගිල්ල.

7. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හම්බන්තොට ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හම්බන්තොට නගරය බටහිර අංක 09 ග්‍රාමයේ ටවර්හිල් මාර්ගයේ ඇති මාටෙලෝ කුළුණ.

8. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හම්බන්තොට ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හම්බන්තොට නගරය බටහිර අංක 09 ග්‍රාමයේ ටවර්හිල් මාර්ගයේ ඇති ප්‍රදීපාගාරය.

9. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හම්බන්තොට ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හම්බන්තොට ග්‍රාමයේ වෙරළ මාර්ගයේ ඇති බන්ධනාගාරයට අයත් පැරණි බැම්ම.

10. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටදූව බටහිර ග්‍රාම නිලධාරි වසමට අයත් බටදූව ග්‍රාමයේ ඇති පෝරඹවත්ත නොහොත් ටැංකියාවත්ත නමින් හඳුන්වන ඉඩමේ පිහිටි ශෛලමය පොකුණ.

11. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වරාතැන්න අංක 439 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වරාතැන්න ග්‍රාමයේ ඇති පැරණි ගල් ළිඳ, (පැරණි සොරොව්ව)

12. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොහොඹිලිවල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කොහොඹිලි වල ග්‍රාමයේ මාතලේ වාරියපොල හන්දියේ ඇති "මාතලේ වාරියපොල කැරැල්ල" සිහිවටන ශිලා පුවරුව.

13. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිරිමල්වත්ත-බටහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සිරිමල්වත්ත අම්බලම.

14. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මෝදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොළඹ 15, මෝදර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මෝදර අළුත් මාවත, එළිහවුස් අංක 521/3 ස්ථානයේ ඇති පැරණි ජල ටැංකි.

15. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 754 මරදාන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මරදාන ග්‍රාමයට අයත් බේරුවල ප්‍රදිපාගාරය.

16. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඩාපයාගල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කුඩාපයාගල ග්‍රාමයට අයත් පයාගල පොලිස් ස්ථානයේ ඇති පැරණි ගොඩනැගිල්ල.

17. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහගොඩයාය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හෙළගම දේවගිරිය ආරණ්‍ය සේනාසන භූමියේ ඇති ලෙන් සංකීර්ණය, ගොඩනැගිලි හා චෛත්‍ය නටබුන් ස්ථාන ඇතුළු අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක.

18. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිරිපුරගම 150-I ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දිග්ගලයාය ග්‍රාමයට අයත් දිග්ගලයාය වැවට යාබද භූමියේ ඇති චෛත්‍ය ගොඩැල්ල සහිත නටබුන් ස්ථානය.

19. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාමිණීපුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පුදාමයාය ග්‍රාමයට අයත් පුදාමයාය ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම් තැම්පතු සහිත ස්ථානය.

20. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහගොඩයාය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මහගොඩයාය රහතුන්කන්ද බුද්ධ රක්ඛිත ආරණ්‍ය සේනාසන භූමියේ පිහිටි කටාරම් කෙටූ ලෙන්.

21. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිරිපුරගම 150-I ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දිග්ගලයාය ග්‍රාමයේ ඇති දඹේආර වැව පාමුල ඇති බුද්ධ ප්‍රතිමාව (අඩක් නිමකල) සහ ශිලා කුළුණු සහිත ගොඩනැගිලි නටබුන් ස්ථාන.

22. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹේයාය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හැබැස්ස ග්‍රාමයට අයත් හැබැස්ස-උතුර ගල්තලාව ආශ්‍රිතව ඇති කටාරම් කෙටූ ලෙන්, පියගැටපේළි සහ කොරි සටහන් සහිත ස්ථාන.

23. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගෝතමීගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගෝතමීගම කටාරම් කෙටූ ලෙන.

24. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙල්ලස්සගම ග්‍රාමයට අයත් රහතන් කන්ද ආරණ්‍ය සේනාසන භූමියේ ඇති කටාරම් සහ ශිලාලේඛන කෙටූ සියළුම ලෙන් සහ පෞරාණික චෛත්‍ය.

25. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇතිලිවැව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ඇතිලිවැවේ පැරණි සොරොව්ව.

26. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව යාල ජාතික වනෝද්‍යාන භූමිය තුළ පිහිටා ඇති පැරණි ස්ථූප, ගොඩනැගිලි නටඹුන්, කටාරම් කෙටූ ලෙන් සහ ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම් තැම්පතු ස්ථාන සහිත වෙහෙරදිවුලාන පුරාවිද්‍යා භූමිය.

27. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාමිණීපුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පුදාමයාය ග්‍රාමයට අයත් පුදාමයාය නමින් හඳුන්වන ස්ථානයේ ඇති පැරණි ගල් කොරි.

28. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැව්ගම්පහ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සොරබොරවැව ග්‍රාමයට අයත් පැරණි සොරොව්ව සහිත සොරබොරවැව.

29. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිදීමාලියද්ද-දකුණ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි රිදීමාලියද්ද ග්‍රාමයට අයත් පෝටැව අම්බලම.

30. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහියංගණය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මාපාකඩවැව ග්‍රාමයට අයත් පැරණි දාගැබ් ගොඩැල්ල සහ ශිලා මෙවලම් අවශේෂ තැම්පතු ස්ථාන ඇතුළු වෙනත් පුරාවිද්‍යාත්මක සාධක සහිත මාපාගොඩ වෙහෙරගොඩැල්ල නමින් හඳුන්වන ගල් පර්වතය.

31. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කහත්තේවෙල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කහත්තේවෙල පැරණි අම්බලම.

32. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ. ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරම්බකාඩු සමනන්කුලම ග්‍රාමයට අයත් ශිලා කුළුණු සහිත ගොඩනැගිලි නටබුන් ස්ථානය.

33. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ. මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුලතිව් නගරය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මුලතිව් ඕලන්ද බලකොටුව.

34. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුලුමච්චිනාදකුලම් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පුලුමච්චිනාදකුලම් ග්‍රාමයට අයත් දාගැබ සහ ගොඩනැගිලි නටබුන් සහිත පුලුමච්චිනාදකුලම් වැව් රක්ෂිතයේ නටබුන්.

35. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුලාම්මුරිප්පු ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කුලාම්මුරිප්පු ගොඩනැගිලි නටබුන් ස්ථානය සහ චෛත්‍ය ගොඩැල්ල.

36. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුතියන්කට්ඩුකුලම් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මුතියන්කට්ටුව ග්‍රාමයට අයත් මුතියන්කට්ටු වැව අසල ඇති ගොඩනැගිලි නටබුන් ස්ථානය.

37. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, මුලතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තඩ්ඩුවාන් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි තඩ්ඩමලේ

ග්‍රාමයට අයත් තඩ්ඩමලෙයි නටබුන් නමින් හඳුන්වන ස්ථානයේ ඇති ගොඩනැගිලි නටඹුන්.

38. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ. ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තන්ඩුවාන් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ඉද්දමඩුව ග්‍රාමයට අයත් ඉද්දමඩුව නටබුන් ස්ථානය නමින් හඳුන්වන ශිලා කුළුණු සහිත ගොඩනැගිලි නටබුන් ස්ථානය.

39. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ. ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තඩ්ඩයාමලේ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි තඩ්ඩයාමලේ ග්‍රාමයට අයත් නටබුන් වූ දාගැබ සහ ගොඩනැගිලි අවශේෂ සහිත ගල් පර්වත දෙක. (තඩ්ඩයාමලේ නටබුන් ස්ථානය)

40. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ. ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගනේෂපුරම් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගනේෂපුරම් ශිලාකුළුණ සහ ශිලාපාදම් සහිත ගොඩනැගිලි නටබුන් ස්ථානය.

41. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ. ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙල්ලම්කුලම් ග්‍රාමයේ පිහිටි ආරාම සංකීර්ණයට අයත් වෙල්ලම්කුලම් නටබුන් ස්ථානය.

42. උතුරු පළාතේ, මන්නාරම් දිස්ත්‍රික්කයේ, මන්තායි-දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉලුප්පකඩවයි 04 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ඉලුප්පකඩවයි ග්‍රාමයට අයත් ඉලුප්පකඩවයි පඩවුතුරෙ මිණුම්කුළුණ.

43. උතුරු පළාතේ, මන්නාරම් දිස්ත්‍රික්කයේ, තලෙයිමන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඕල්ඩ්පියර් ග්‍රාමයට අයත් තලෙයිමන්නාරම පැරණි ජැටිය.

44. උතුරු පළාතේ, මන්නාරම් දිස්ත්‍රික්කයේ, මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඌරුමලෛ 49-දකුණ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ඌරුමලෛ ග්‍රාමයට අයත් ඌරුමලෛ පැරණි ප්‍රදීපාගාරය.

45. උතුරු පළාතේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, පූනරීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගෞතාර්මූනෙයි KN 68 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කල්මුනේ ග්‍රාමයට අයත් පැරණි මිණුම් කුළුණ.

46. උතුරු පළාතේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උට්ටුපුලම් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි උට්ටුපුලම් ග්‍රාමයට අයත් නටබුන් වූ ස්ථූප ගොඩැල්ල, ගොඩනැගිලි නටබුන් සහ පැරණි ළිඳ සහිත උට්ටුපුලම් නටබුන් ස්ථානය.

47. උතුරු පළාතේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, පූනරීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලිකුඩා අංක 65 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අරිසපුරම් ග්‍රාමයට අයත් අරිසපුරම් අල්ලිරාණි කොටුව නමින් හඳුන්වන ස්ථානයේ ඇති නටබුන් ගොඩැලි.

48. උතුරු පළාතේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අක්කරායන් අංක 5 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අක්කරායන් ග්‍රාමයට අයත් නටබුන් ගොඩැල්ල.

49. උතුරු පළාතේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශිවනගර් අංක 35 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ශිවනගර් ග්‍රාමයට අයත් ශිවනගර් කෝවිල් භූමියේ ඇති චෛත්‍ය ගොඩැල්ල සහ නටබුන් ගොඩනැගිලි.

50. උතුරු පළාතේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, පූනරීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මට්ටුවිල්නාඩු දකුණ අංක 35 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පූනරීන් නගරය ග්‍රාමයට අයත් පූනරීන් ලන්දේසි බලකොටුව.

51. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, මල්ලාවි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ආලන්කුලම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ආලන්කුලම ග්‍රාමයට අයත් ආලන්කුලම ස්තූප නටඹුන්. (65 යුධ හමුදා සේනාංක මූලස්ථානය අසළ)

52. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කල්විලාන් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කල්විලාන් ග්‍රාමයට අයත් ශිලා කුළුණු සහිත ගොඩනැගිලි නටබුන් ස්ථානය.

53. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, චත්‍යාඅඩම්පන් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අම්බකාමම් ග්‍රාමයට අයත් උදියකුරුප්පුකුලම් වැව අසළ ඇති ආරාම සංකීර්ණයකට අයත් නටබුන් ස්ථානය.

54. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මන්නකන්ඩාල් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මන්නකන්ඩාල් ග්‍රාමයට අයත් කන්නියාර් කෝවිල් නටබුන් නමින් හඳුන්වන ස්ථානයේ ඇති චෛත්‍ය ගොඩැල්ල, ශිලා කුළුණ සහ ගොඩනැගිලි නටබුන් සහිත බෞද්ධ ආරාම සංකීර්ණයක නටඹුන්.

55. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොමළමුනේ මධ්‍යම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි නෛත්තික්කායිකුලම් ග්‍රාමයට අයත් නෛත්තික්කායිකුලම් චෛත්‍ය ගොඩැල්ල සහිත නටබුන් ස්ථානය.

56. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, වැලිඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජනකපුර-05 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ජනකපුර අළුත් පාසල පිටුපස ඇති ශිලා කුළුණු සහිත ගොඩනැගිලි නටබුන් ස්ථානය.

57. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුතියංකට්ටුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මුතියංකට්ටුව යුධ හමුදා පුහුණු පාසල අසළ ඇති පැරණි දාගැබ, ප්‍රතිමාගෘහය සහ අනෙකුත් ගොඩනැගිලි නටබුන් ස්ථාන.

58. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරිඉබ්බන්වැව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කිරිඉබ්බන්වැව ග්‍රාමයට අයත් නයාරු පැරණි දාගැබ.

59. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කච්චිලාමඩු ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කච්චිලාමඩු ග්‍රාමයට අයත් පන්ඩාරවන්නියන් ස්මාරකය.

60. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, තුණුක්කායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුත්තුවෙඩ්ඩුවාන් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පුත්තුවෙඩ්ඩුවාන් ග්‍රාමයට අයත් ශිලා කුළුණු සහිත මරදකුලම් නටබුන් ස්ථානය.

61. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, තුණුක්කායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 85 නාගපාදන් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පුත්තුවෙඩ්ඩුවාන් ග්‍රාමයට අයත් ගොඩනැගිලි නටබුන් සහිත පුත්තුවෙඩ්ඩුවාන් නටබුන් ස්ථානය.

62. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, තුණුක්කායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 85 නාගපාදන් ග්‍රාමනිලධාරි වසමේ පිහිටි පලෙයිමුරුගන්ඩි ග්‍රාමයට අයත් ගොඩනැගිලි නටබුන් සහිත අම්බලාවිකුලම් නටබුන් ස්ථානය.

63. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, තුණුක්කායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 36 නාගපාදන් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පලෙයිමුරුගන්ඩි ග්‍රාමයට අයත් ගොඩනැගිලි නටබුන් සහිත අම්බලාවිකුලම් නටබුන් ස්ථානය.

64. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, තුණුක්කායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 32 තෙන්නියන්කුලම් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි තෙන්නියන්කුලම් ග්‍රාමයට අයත් ගොඩනැගිලි නටබුන් සහිත තෙන්නියන්කුලම් නටබුන් ස්ථානය.

65. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, තුණුක්කායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 18 උයිලන්කුලම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි නීරාවිය ග්‍රාමයට අයත් දාගැබ් සහ ගොඩනැගිලි නටබුන් සහිත උයිලන්කුලම් නීරාවි නටබුන් ස්ථානය.

66. උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, තුණුක්කායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොඩ්ඩියාර්කට්ටිකුලම් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි උයිලන්කුලම් ග්‍රාමයට අයත් අම්බලපෙරුමාල් වැව අසළ ඇති ගොඩනැගිලි නටබුන් ස්ථානය.

67. උතුරු මැද පළාතේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 215 දිවුල්වැව බඹරහෙල තුලාන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බඹරහෙල දේවගිරි රජමහ විහාරය භූමියේ ඇති කටාරම් සහ ශිලාලේඛන සහිත ලෙන් සංකීර්ණය පිහිටි බඹරහෙල කන්ද, විහාර භූමියේ ඇති චෛත්‍ය ගොඩැල්ල සහ අනෙකුත් පුරාවිද්‍යාත්මක අවශේෂ.

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2013 නොවැම්බර් මස 27 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට ත්‍රිකුණාමලයේ ප්‍රසිද්ධ නොතාරිස් තිලගරත්නම් තුශ්යාන්තම් විසින් ලියා සහතික කරන ලද අංක 843 හා 2011 ජනවාරි මස 13 වැනි දින ද, අංක 1516 හා 2012 මාර්තු 30 වැනි දිනද, අංක 1747 හා 2012 අගෝස්තු මස 21 වැනි දින ද දරන සියලු උකස් බැඳුම්කර මත, අයවිය යුතු මුදල් ගෙවීම්, "විග්මන් එන්ටප්‍රයිසස්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ ත්‍රිකුණාමලය, මහ වීදිය (මේන් ස්ට්‍රීට්) අංක 329 දරන ස්ථානයේ ව්‍යාපාරය කරගෙන යන, ෂන්මුගම් විග්නේස්වරන් යන අය පැහැර හැර ඇති හෙයින් ද,

2013 සැප්තැම්බර් මස 30 වැනි දිනට එකී ෂන්මුගම් විග්නේස්වරන් යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් එක්කෝටි විසිඅට ලක්ෂ හැත්තෑ දහස් තුන්සිය විසි අටකුත් ශත පනස් හතරක (රු. 1,28,70,328.54) මුදලක් සහ 2013 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පණස් හයලක්ෂ අනූනව දහස් නවසිය හැත්තෑ අටක් (රු. 56,99,978) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය,

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

මත පොළිය ද රුපියල් විසිපන් ලක්ෂ හැට අට දහස් දෙසිය අනූදෙකක් (රු. 25,68,292) සඳහා එක් එක් මාසයේ ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක ණය පොළි අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්.) වර්ෂයකට සියයට නවයක් (9%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය ද රුපියල් තිස්පන් ලක්ෂයක් (රු. 35,00,000) සඳහා ක් එක් මාසයේ ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන, බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතියකට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට අටකුත් දශම හතක් (8.7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් එක්කෝටි විසිඅට ලක්ෂ හැත්තෑ දහස් තුන්සිය විසි අටකුත් ශත පනස් හතරක (රු. 1,28,70,328.54) මුදලක් සහ 2013 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පණස් හයලක්ෂ අනූනව දහස් නවසිය හැත්තෑ අටක් (රු. 56,99,978) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන, මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම් :

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය,

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

මත පොළිය ද රුපියල් විසිපන් ලක්ෂ හැට අට දහස් දෙසිය අනූදෙකක් (රු. 25,68,292) සඳහා එක් එක් මාසයේ ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක ණය පොළි අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්.) වර්ෂයකට සියයට නවයක් (9%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකයක් මත පොලිය ද, රුපියල් තිස්පන් ලක්ෂයක් (රු. 35,00,000) සඳහා එක් එක් මාසයේ ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර, බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතියකට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට අටකුත් දශම හතක් (8.7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 843, 1516 සහ 1747 දරන උකස් බැඳුම්කර මගින් එකී ෂන්මුගම් විග්නේස්වරන් විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ ෂොක්මන් සහ සමරවික්‍රම බලයලත් වෙන්දේසිකරුවන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 843, 1516 සහ 1747 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ත්‍රිකුණාමලය නගර සභා සීමාව ඇතුළත, අංක 7 "පෙරුන්තෙරු" නගර සභා කොට්ඨාසයේ පිහිටි, ත්‍රිකුණාමලය, මහ වීදිය (මේන් සට්‍රීට්) වරිපනම් අංක 323, 323/1, 323/2.,323/3, 325, 327, 327/1, 327/2 සහ 327/3 දරන හා බලයලත් මානක පී. මහේන්ද්‍රනාතන් විසින් සකස් කළ අංක 1866 හා 2008.06.15 වැනි දින දරන පිඹුරේ ලොට් A ලෙස ලකුණු කළ බිම් කට්ටියට මායිම්, උතුරට : කේ. ෂන්මුගම්ගේ උරුමකරුවන් හිමිකම් කියන දේපළ සහ මහවීදිය (මේන් ස්ට්‍රීට්) ද, නැගෙනහිරට : මහවීදිය (මේන් ස්ට්‍රීට්) සහ ආචාර්ය/දොස්තර තම්බයියාගේ උරුමකරුවන් හිමිකම් කියන දේපළ ද, දකුණට : ආචාර්ය/දොස්තර තම්බයියාගේ උරුමකරුවන් සහ වරතකුමාර් හිමිකම් කියන දේපළ ද, බස්නාහිරට : වරතකුමාර් සහ ෂන්මුගම්ගේ උරුමකරුවන් හිමිකම් කියන දේපළ ද යන මායිම් ඇතුළත පර්චස්

විසිතුනකුත් දශම තුනයි අටක් (අ. 0, රූ. 0, පර්. 23.38) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එය හා සම්බන්ධ සියලු අයිතිවාසිකම් ද වේ.

ඉහත සඳහන් ඉඩම ත්‍රිකුණාමලයේ බලයලත් මානක පී. මහේන්ද්‍රනාතන් විසින් නැවත මනින ලදුව සකස් කරන ලද අංක 1866A හා 2012.03.25 වැනි දින දරන පිඹුරේ ලොට් A ලෙස නිරූපනය කර, නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ත්‍රිකුණාමලය නගර සභා සීමාව ඇතුළත, අංක 7 "පෙරුන්තෙරු" නගර සභා කොට්ඨාසයේ පිහිටි. ත්‍රිකුණාමලය මහ වීදිය (මේන් සට්‍රීට්) වරිපනම් අංක 323, 323/1, 323/2. 323/3, 325, 327, 327/1, 327/2 සහ 327/3 දරන උතුරට : කේ. ෂන්මුගම්ගේ උරුමකරුවන් හිමිකම් කියන දේපළ සහ මහවීදිය (මේන් ස්ට්‍රීට්) ද, නැගෙනහිරට : මහ වීදිය (මේන් ස්ට්‍රීට්) සහ ආචාර්ය/දොස්තර තම්බයියාගේ උරුමකරුවන් හිමිකම් කියන දේපළ ද, දකුණට : ආචාර්ය/දොස්තර තම්බයියාගේ උරුමකරුවන් සහ වරතකුමාර් හිමිකම් කියන දේපළ සහ බස්නාහිරට : වරතකුමාර් සහ ෂන්මුගම්ගේ උරුමකරුවන් හිමිකම කියන දේපළ ද යන මායිම් ඇතුළත පර්චස් විසිතුනකුත් දශම තුනයි අටක් (අ. 0, රූ. 0, පර්. 23.38) බිම් ප්‍රමාණයෙන් යුත් පරිශ්‍රය සහ එහි පිහිටි වෙනත් සියලු දේ ලෙස විස්තර කර ඇත. මෙම ඉඩම ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

03 - 601

---

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - ගාල්ල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගණුදෙනුකරුගේ නම : උපුලි ඕෆ්සෙට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.01.27 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :

එනම්, උපුලි ඕෆ්සෙට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායියා වශයෙන් ද පුවක්දන්ඩාවේ ලොකුආචාරිගේ සෝමපාල උකස්කරු වශයෙන් ද කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එස්. මරික්කාර් විසින් ලියා සහතික කරන ලද අංක 11095 සහ 2010 ජනවාරි මස 15 දිනැති සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රි විසින් ලියා සහිතක කරන ලද 2010 ජූලි මස 07 දිනැති අංක 1965 දරන උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 11095 සහ 1965 දරන උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක්,

වර්ෂ 2015.12.06 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් හතළිස් හය මිලියන හය ලක්ෂ විසි දහස් හත්සිය දොළහයි ශත තිස් දෙක (රු. 4,66,20,712.32)ක මුදල සහ 2015.12.07 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් මිලියන හතළිස් හතර (රු. 4,40,00,000)ක මුදල මත වර්ෂයකට සියයට දාහතර (14%) බැගින් පොලිය ද, ඉහත කී බන්ධනදායිගෙන් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්,

එකී අංක 1965 සහ 11095 දරන උකස්කරයන් මත අයවිය යුතු මුදල් රුපියල් හතළිස් හය මිලියන හය ලක්ෂ විසි දහස් හත් සිය දොළහයි ශත තිස් දෙක (රු.4,66,20,712.32)ක මුදල ඉහත කී දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද, අංක 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් සහ ගාස්තු ද අයකර ගැනීම සඳහා (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) මෙහි උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට අංක 182/3 (50/3), විහාර මාවත, කොළොන්නාවහි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න වෙත එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

**උපලේඛනය**

1. දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ සහ ගාලු මහ නගර සභා සීමාව තුළ දන්ගෙදර පිහිටි ක්‍රිප්ස් පාරේ වරිපනම් අංක 47 දරන ගල්වැටියේවත්ත හෙවත් දොලමුල්ලේවත්ත හෙවත් මෝලේගෙදරවත්ත නැමැති ඉඩමට බලයලත් මානක එස්. ඒ. බීබී විසින් මැන සාදන ලද අංක 1468 සහ 1958 සැප්තැම්බර් මස 20 දිනැති සැලැස්මේ ලොට් 1සී වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : තල්ගහවත්ත ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් 1බී සහ ලොට් 1ඊ ද, දකුණට : ක්‍රිප්ස් පාර සහ බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් 1ඩී4 සහ 1ඩී1 දරන ඉඩම් කැබලි යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි, පර්චස් තිස්පහයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 2, පර්. 35.50) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි කුසුමලා නැමැති නිවස සහ පරිශ්‍රය සහ ගහකොළ, පළතුරු වගාවන් ඇතුළු සියලු දේ වේ. ගාල්ල ඉඩම් ලියපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 561/107හි ලියාපදිංචි කර ඇත.

මෑත දී සාදන ලද මැනුමක් අනුව එකී අංක 1468 සැලැස්මේ ලොට් 1සී දරන බිම් කැබැල්ල පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත :

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ සහ ගාලු මහ නගර සභා සීමාව තුළ දන්ගෙදර පිහිටි ක්‍රිප්ස් පාරේ වරිපනම් අංක 47 දරන ගල්වැටියේවත්ත හෙවත් දොලමුල්ලේවත්ත හෙවත් මෝලේගෙදරවත්ත නැමැති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. එන්. වික්‍රමසේකර විසින් මැන සාදන ලද අංක 674 සහ 2000 පෙබරවාරි මස 24 දිනැති සැලැස්මේ ලොට් ඒ වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති උතුරට : තල්ගහවත්ත ද, නැගෙනහිරට : ලොට් 1බී සහ පාර ද, දකුණට : ක්‍රිප්ස් පාර සහ බස්නාහිරට : ලොට් 1ඩී1 සහ 1ඩී4 සහ හැගොඩ

රාළගේ වත්ත යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් විසි හතයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 2, පර්. 27.50) ක් වූ විශාල ඉඩම සහ එහි තුළ පිහිටි "කුසුමලා" නැමැති නිවස සහ පරිශ්‍රය සහ ගහකොළ, පළතුරු වගාවන් ඇතුළු සියලු දේ වේ.

පහත ඉඩම මත මාර්ග අයිතිය ද සමගින් වේ :

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ සහ ගාලු මහ නගර සභා සීමාව තුළ දන්ගෙදර පිහිටි ගල්වැටියේවත්ත හෙවත් දොලමුල්ලේවත්ත හෙවත් මොලේගෙදරවත්ත නැමැති ඉඩමට බලයලත් මානක එස්. ඒ. බීබී විසින් මැන සාදන ලද අංක 1468 සහ 1958 සැප්තැම්බර් මස 20 දිනැති සැලැස්මේ ලොට් 1ඊ වශයෙන් බෙදා වෙන් කොට සීමා නීර්ණය කර ඇති උතුරට සහ ඊසාන දිගට : මෙම ඉඩමේම ලොට් 1බී ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් 1ඒ ද, දකුණට : ක්‍රිප්ස් පාර සහ බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් 1සී යන මායිම් තුළ පිහිටි පර්චස් අට (අ. 0, රූ. 0, පර්. 8) ක් වූ විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ ඒ 561/108හි ලියාපදිංචි කර ඇත.

2. දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ සහ ගාලු මහ නගර සභා සීමාව තුළ මිලිද්දුවෙහි පිහිටි දෙල්ගහවත්ත සහ දෙල්ගහදූවේවත්ත නැමැති ඉඩමට බලයලත් මානක එච්. විසුම්පෙරුම විසින් මැන සාදන ලද අංක 400 සහ 1970.06.20 දිනැති සැලැස්මේ ලොට් 1 වශයෙන් බෙදා වෙන්කොට සීමා නීර්ණය කර ඇති උතුරට : බලයලත් මානක ඒ. අයි. ද එස්. සෙනෙවිරත්න විසින් මැන සාදන ලද අංක 662 සහ 1964.06.04 දරන සැලැස්මේ ලොට් 3 සහ මහවත්තඕවිට ද, නැගෙනහිරට : මහා පාර ද, දකුණට : ඉහත කී අංක 662 සැලැස්මේ ලොට් 7 පාර සඳහා වෙන් කරන ලද බිම් කොටස සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් 11 යන මායිම් තුළ පිහිටි පර්චස් තිහ (අ. 0, රූ. 0, පර්. 30) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු වගාවන් ඇතුළු සියලු දේ වේ. ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ ඒ 681/85හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 1 දරන බිම් කැබැල්ල මෑතක දී සාදන ලද බලයලත් මානක ඒ. ආර්. වීරසූරිය විසින් මැන සාදන ලද අංක 2303 සහ 2008.08.02 දිනැති සැලැස්ම අනුව පහත දැක්වෙන අයුරු විස්තර කර ඇත.

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ සහ ගාලු මහ නගර සභා සීමාව තුළ මිලිද්දුවෙහි පිහිටි දෙල්ගහවත්ත සහ දෙල්ගහදූවේවත්ත නැමැති ඉඩමෙ මොරිස් පාරේ වරිපනම් අංක 73 දරන ලොට් 1 (බලයලත් මානක එච්. විසුම්පෙරුම විසින් මැන සාදන ලද අංක 400 සහ 1970.06.20 දිනැති පිඹුරේ ලොට් 1 දරන කැබැල්ල නැවත මැනුමක්) වශයෙන් බෙදා වෙන් කොට සීමා නීර්ණය කර ඇති ඊසානදිගට : අංක 662 දරන සැලැස්මේ ලොට් 3 සහ මහවත්තඕවිට ද, ගිණිකොනට : ගාල්ල සිට ලබුදූවට දිවෙන මහා මාර්ගය ද, නිරිතදිගට : අංක 662 සැලැස්මේ ලොට් 7 වශයෙන් පෙන්වා ඇති පාර ද, සහ බස්නාහිරට : පාර සහ වයඹට : මෙම ඉඩමේ ලොට් 11 යන මායිම් තුළ පිහිටි පර්චස් තිහ (අ. 0, රූ. 0, පර්. 30) ක් හෝ හෙක්යාර් 0.07588 ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු වගාවන් ඇතුළු සියලු දේ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉරාන්ත් රොද්‍රිගෝ,
කළමනාකරු - ණය අයකර ගැනීම්.

03 - 713

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : ගරුඩා ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.01.27 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :

එනම්, ගරුඩා ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එන්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2014.07.03 දිනැති අංක 5307 දරන උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 5307 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2015.10.15 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය ද වශයෙන් රුපියල් දස මිලියන පන්ලක්ෂ හැට දෙදහස් හත්සිය හතළිහයි ශත විසි හය (රු. 1,05,62,740.26)ක මුදල සහ 2015.10.16 වැනි දින සිට රුපියල් දස මිලියන හාර ලක්ෂ එකොළොස් දහස් අටසිය අනූ හතරයි ශත හැට හත (රු. 1,04,11,894.67)ක මුදල මත වාර්ෂිකව 16.5% බැගින් පොලිය ද සහ 2015.10.15 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් දාහතර මිලියන එක් ලක්ෂ හැටහය දහස් නවසීය විසි පහයි ශත පහළව (රු. 1,41,66,925.15)ක මුදල සහ 2015.10.16 වැනි දින සිට රුපියල් දහතුන් මිලියට නව ලක්ෂ හැට හතර දහස් නවසිය දොළහයි ශත දහ අට (රු. 1,39,64,912.18)ක මුදල මත වාර්ෂිකව 16.5%ක බැගින් පොලිය ද පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්,

එකී අංක 5307 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් විසිහතර මිලියන හත් ලක්ෂ විසි නව දහස් හයසිය හැට පහයි ශත හතළිස් එක (රු.2,47,29.665.41)ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද, ගාස්තු ද අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 180/3 (50/3) දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

උපලේඛනය

දකුණු පළාතේ, (ගාල්ල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත) ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, අක්මීමණ ප්‍රාදේශීය ලේකම් සහ ප්‍රාදේශීය සභා කොට්ඨාසය ඇතුළත, යටගම ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 133බී කොට්ඨාසය ඇතුළත, යටගම ග්‍රාමයෙහි 'සුසීමා එස්ටේට්' නමැති ඉඩම

බලයලත් මානක ටී. ජී. උපසේන විසින් සකසන ලද 2013 මැයි මස 08 දිනැති පිඹුරු අංක 1178ඒ හි ලොට් ඒ වශයෙන් දක්වා (ඇති බලයලත් මානක කේ. ජී. ජේ. ද සිල්වා විසින් සකසන ලද 2003.09.06 දිනැති අංක 44/2003 දරන පිඹුරෙහි ලොට් ඩීඒ සහ බලයලත් මානක ටී. ජී. උපසේන විසින් සකසන ලද 2010.11.26 දිනැති අංක 914 දරන පිඹුරෙහි ලොට් 3 වශයෙන් දක්වා ඇති බෙදා වෙන් කල යාබද කොටසෙහි නැවත මැනුමක් සහ අතුරු බෙදීමක් වන, උතුරට : පිඹුර අංක 914 හි ලොට් 2 ද, නැගෙනහිරට : එම ඉඩමෙහිම කොටසක් සහ පිඹුර අංක 1178ඒ හි ලොට් බී ද, දකුණට : කඩොලාන සහ ඇල ද සහ බස්නාහිරට : ගම් සභා පාර (ප්‍රධාන පාරේ සිට නිවාස වල) මායිම් වූ ඉහත කී පිඹුරු අංක 1178ඒ ට අනුව ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුන (අ. 2, රූ. 3, පර්. 0) ක් වූ ඉඩම සහ ගහකොළ, වැව්ලි සහ ඒ මත වූ සියල්ල ද සමග වේ. ගාල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හිමිකම් J 51/50 යටතේ ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉරාන්ත් රොද්‍රිගෝ,
කළමනාකරු - අයකර ගැනීම්.

03 - 714